# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2211/56 – 2021 ජනවාරි 21 වැනි බ්‍රහස්පතින්දා – 2021.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 13/1978 (III)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

ශ්‍රේෂ්ඨාධිකරණ රීති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා විසින් සහ ඒ ව්‍යවස්ථාව යටතේ ඔහු විසින් නම් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයන් විසින් සාදනු ලබන රීති.

1. අග්‍ර විනිශ්චයකාර ජයන්ත ජයසූරිය
2. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර බී. පී. අලුවිහාරේ
3. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර කේ. එස්. ජේ. ද ආබෲ
4. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර පී. ජයවර්ධන

2021 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මේ රීති 2021 ශ්‍රේෂ්ඨාධිකරණ (තාවකාලික විධිවිධාන) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 1991 ජුනි මස 7 වන දින අංක 665/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1990 ශ්‍රේෂ්ඨාධිකරණ රීතිවල 7 වන රීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, 7 වන රීතියේ සඳහන් සති හයක කාල සීමාව ගණනය කිරීමේ දී 2020 ඔක්තෝබර් මස 24 වන දිනයෙන් ආරම්භව 2021 ජනවාරි මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සැළකිල්ලට ගනු නොලැබිය යුතු ය.

ජයන්ත ජයසූරිය,
අග්‍ර විනිශ්චයකාර.

බී. පී. අලුවිහාරේ,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

කේ. එස්. ජේ. ද ආබෘ,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

පී. ජයවර්ධන,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

02 – 18/1

---

එල්.ඩී.බී. 13/1978 (III)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

2021 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) (තාවකාලික විධිවිධාන) රීති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා විසින් සහ ඒ ව්‍යවස්ථාව යටතේ ඔහු විසින් නම් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයන් විසින් සාදනු ලබන රීති.

1. අග්‍ර විනිශ්චයකාර ජයන්ත ජයසූරිය
2. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර බී. පී. අලුවිහාරේ
3. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර කේ. එස්. ජේ. ද ආබෘ
4. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර පී. ජයවර්ධන

2021 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

### රීති

1. මේ රීති 2021 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) (තාවකාලික විධිවිධාන) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1989 මාර්තු මස 13 වන දින අංක 549/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1988 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙතින් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) රීතිවල 2 (1) (අ) රීතියේ, 2 (2) රීතියේ, 11 (3) රීතියේ සහ 12 (2) රීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා -

(අ) 2 (1) (අ) රීතියේ සඳහන් දින දාහතරක කාලසීමාව ගණනය කිරීමේ දී 2020 ඔක්තෝබර් මස 24 වන දිනයෙන් ආරම්භව 2021 ජනවාරි මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සැළකිල්ලට ගනු නොලැබිය යුතු ය;

(ආ) 2 (2) රීතියේ සඳහන් දින විසි අටක කාලසීමාව ගණනය කිරීමේ දී 2020 ඔක්තෝබර් මස 24 වන දිනයෙන් ආරම්භව 2021 ජනවාරි මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සැළකිල්ලට ගනු නොලැබිය යුතු ය;

(ඇ) 11 (3) රීතියේ සඳහන් දින දාහතරක කාලසීමාව ගණනය කිරීමේ දී 2020 ඔක්තෝබර් මස 24 වන දිනයෙන් ආරම්භව 2021 ජනවාරි මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සැළකිල්ලට ගනු නොලැබිය යුතු ය; සහ

(ඈ) 12 (2) රීතියේ සඳහන් දින හැටක කාලසීමාව ගණනය කිරීමේ දී 2020 ඔක්තෝබර් මස 24 වන දිනයෙන් ආරම්භව 2021 ජනවාරි මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සැළකිල්ලට ගනු නොලැබිය යුතු ය.

ජයන්ත ජයසූරිය,
අග්‍ර විනිශ්චයකාර.

බී. පී. අලුවිහාරේ,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

කේ. එස්. ජේ. ද ආබෲ,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

පී. ජයවර්ධන,
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

02 – 18/2